# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-12-21 |

පැමිණිලි පාර්ශවය : ඕ.ඒ. කාන්ති මිය,
නො 75/2, මල්වත්ත පාර,
දෙහිවල.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
බප/පිළි/ඇස්.ද ඇස්. ජයසිංහ මධ්‍ය විද්‍යාලය,
දෙහිවල.

**පැමිණිලි අංකය : HRC/1144/18**

**පැමිණිල්ලේ කරුණු සැලකිරීම :-**

උක්ත පැමිණිලිකාරිය විසින් 2018-05-04 දාතමින් මානව හිමිකම කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම ඥාති පුත්‍රයෙකු වන ඉහත පාසලේ 7 ශ්‍රේණියේ අධ්‍යාපනය ලැබූ පී.ඒ. නුවන්ත තාරුන්‍ය දරුවාව පාසලේ විදුහල්පතිවරයා වන පී.පී.ඩී. චන්ද්‍රසෝම පතිරණ මහතා විසින් 2018-05-03 වන දින 7 වන කාලපරිච්ඡේදය තුළදී වේවැලකින් පහරදී ඇති බවත්, එම පහරදීම හේතුවෙන් දරුවාගේ වම් කණ ප්‍රදේශය ආබාධයට ලක්වූ බවත්ය. මේ සිද්ධීන් පිළිබඳව තමා දැනුවත්වූයේ දරුවා පාසල අවසන්ව නිවසට පැමිණි පසුව බවත්, සිද්ධිය දැනගැනීමෙන් පසුව දෙහිවල පොලිස් ස්ථානයේද මේ පිළිබඳ පැමිණිලි කර ඇති බවත්, පසුව පොලීසිය විසින් දරුවා වෛද්‍යවරයෙකු වෙත යොමු කර ඇති බවත්, එහිදී වෛද්‍යවරයා විසින් දරුවා පරීක්ෂා කර ඇති බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත. තමා මෙම පැමිණිල්ල මගින් අපේක්ෂා කරනු ලබන්නේ තම ඥාති පුත්‍රයාට වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් සිදු කර ඇති පහරදීම පිළිබඳව පරීක්ෂණයක් සිදුකර එවැනි සිද්ධීන් ඉදිරියේ ඇතිවීම වළක්වා ගැනීම වන අතර, මෙම විදුහල්පතිවරයා මෙම පාසලෙන් ඉවත් කිරීමට කටයුතු කර දෙන ලෙසද ඉල්ලා ඇත.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු සැළ කිරීම් :-**

**විදුහල්පති, එස්. ද එස්. ජයසිංහ මධ්‍ය විද්‍යාලය, දෙහිවල පී.පී.ඩී. චන්ද්‍රසෝම පතිරණ මහතාගේ කරුණු දැක්වීම :-**

ඉහත වගඋත්තරකරු විසින් පැමිණිල්ලට අදාලව 2018-05-18 දින පැවති පරීක්ෂණයේදී කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිල්ලේ සදහන් 2018-05-03 වන දින තමා පාසලේ අධීක්ෂණ කටයුතු වල නිරත වෙමින් සිටියදී 7 වන කාලපරිච්ඡේදයේ 6-7 පන්ති පැවැත්වෙන ප්‍රදේශයෙන් හූ හඩක් ඇසුන බවත්, පසුව තමා එම ස්ථානයට ගොස් විමසා බැලීමේදී පන්තියේ සිසුන් විසින්, 'හූ නැගුවේ පැමිණිලිකාරියගේ ඥාති පුත්‍රයා වන නුවන්ත තාරුන්‍ය යන අය බව' පැවසූ බවත්, පසුව තමා විසින් මෙම දරුවාට වේවැලකින් පිටුපස ප්‍රදේශයට පහරක් එල්ල කිරීමේදී, එම සිසුවා ඉන් වැළකීමට උත්සාහ කිරීමේදී හිසට හෝ පිට ප්‍රදේශයට එම පහර වැදෙන්නට ඇතැයි තමා විශ්වාස කරන බවත් ප්‍රකාශ කර ඇත. මෙම පහරදීම ද්වේශසහගත චේතනාවෙන් සිදුකළ එකක් නොවන බවත්, මෙවැනි සිදුවීම් ඉදිරියටත් සිදුවීම වලක්වා ගැනීම සදහා අනුගමනය කළ පියවරක් බවත්, තමා දන්නා පරිදි මෙම දරුවා මීට පෙරද පාසල තුළ විනය විරෝධීව හැසිරීම නිසා තමා ඇතුළු ආචාර්ය මණ්ඩලය ඔහුට අවවාද කර ඇති බවත්, ඊට අමතරව මෙම දරුවා ශිෂ්‍ය උපදේශකවරිය වෙතද උපදේශනය සදහා යොමු කර ඇති බවත් පවසා ඇත.

**පැමිණිල්ල මගින් අගතියට පත් පාර්ශවය බව ප්‍රකාශ කරන නුවන්ත තාරුන්‍ය ශිෂ්‍යයාගේ ප්‍රකාශය :-**

2018.05.18 දිනැති පරීක්ෂණයේදී අගතියට පත් පුද්ගලයා ලෙස ප්‍රකාශ කර ඇති ජී.ඒ. නුවන්ත තාරුන්‍ය දරුවා වෙතින් සිද්ධියට අදාලව කරුණු විමසීමේදී දරුවාගේ මිත්තනිය ප්‍රකාශ කරන කරුණු සත්‍ය බව ප්‍රකාශ කර ඇත. මීට අමතරව ඔහු විසින් තම අත්අකුරින් 2018-05-03 දිනැතිව "උපදේශක ගුරුතුමියනි" යන ආමන්ත්‍රණයෙන් ලියා ඇති ලිපියේ සදහන් පරිදි වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් තමාට පහර දුන් බව සහ එම පහරදීම හේතුවෙන් තමාගේ කණ ඉදිමී තිබුණු බව ප්‍රකාශ කර ඇත.

**වෛද්‍ය සාක්ෂි :-**

මෙම පැමිණිල්ලට අදාලව පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර තිබූ කරුණු අනුව 2018-05-22 දිනැතිව අධිකරණ වෛද්‍ය නිලධාරී ශික්ෂණ රෝහල කළුබෝවිල වෙතින් වෛද්‍ය වාර්තාව කැදවා ඇති අතර, 2018-06-05 දින නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන්

සභාව වෙත යොමු කර ඇත. එම වෛද්‍ය වාර්තාවේ සදහන් පරිදි රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය යටතේ සදහන් කර ඇත්තේ, 'නුවන්ත තාරුන්‍ය දරුවා පන්ති කාමරය තුළ චිත්‍ර අදිමින් සිටියදී කවුරුන් හෝ සිසුවෙක් ශබ්ද නගා ඇති බවත්, ඒ පිළිබඳව විදුහල්පතිවරයා තමාගෙන් ප්‍රශ්න කිරීමෙන් පසුව, 'හු තැබූ පුද්ගලයා නොදන්නා බව ප්‍රකාශ කළ අවස්ථාවේ විදුහල්පතිවරයා විසින් සිසුවාගේ වම් කණ ප්‍රදේශයට වේවැලකින් පහරදී ඇති බවයි.' එම පහරදීම හේතුවෙන් අදාළ සිසුවාගේ පිට ප්‍රදේශයේ සහ කණ ප්‍රදේශයේ ආසාධිත තත්වයන් ඇතිවී තිබෙන බව අධිකරණ වෛද්‍ය නිලධාරි සිය වෛද්‍ය වාර්තාවේ සදහන් කර ඇත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

මෙම පැමිණිල්ලට අදාළව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කරන ලිඛිත හා වාචික කරුණු සැලකිල්ලට ගැනීමේදී පහත සදහන් නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකිය.

- පැමිණිලිකාරිය සහ පැමිණිල්ල මගින් අගතියට පත් බව සදහන් නුවන්ත තාරුන්‍ය දරුවා සිද්ධියට අදාළව ප්‍රකාශ කරන පරිදි අදාළ පහරදීමේ සිද්ධියෙන් පසුව අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් සිදු කර ඇති පරීක්ෂාවේදී සහ පසුව නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවේ සදහන් කරුණු වල සමාන බවක් නිරීක්ෂණය වේ.

- පැමිණිල්ල මගින් වගඋත්තරකාර පාර්ශවය ලෙස නම් කර ඇති දෙහිවල එස් ද එස් ජයසිංහ විදුහලේ විදුහල්පතිවරයා ලෙස කටයුතු කර ඇති පී.පී.ඩී. චන්ද්‍රසෝම පතිරණ මහතා විසින් පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කරන පරිදි අගතියට පත් බව සදහන් නුවන්ත තාරුන්‍ය දරුවාට පැමිණිල්ලේ සදහන් දිනයේ වේවැලකින් පහර දුන් බවට පිළිගෙන ඇත.

**නිගමනය :-**

මෙම පැමිණිල්ලට අදාළව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති පරිදිත්, පැමිණිලි පාර්ශවය විසින් සිය පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇති පරිදිත්, වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් පිළිගෙන ඇති පරිදි, පැමිණිලිකාරියගේ ඥාති පුත්‍රයා වන දෙහිවල එස් ද එස් ජයසිංහ විදුහලේ ඉගෙනුම ලබමින් සිටි නුවන්ත තාරුන්‍ය දරුවා හට 2018-05-03 වන දින යම් පහරදීමක් සිදුව ඇති බවට අනාවරණය වී ඇත. එකී සිදු කරන ලද පහරදීමක් හේතුවෙන් එම දරුවා හට ශාරීරික තුවාල සිදුවී ඇති බව වෛද්‍ය සාක්ෂි මගින් සනාථ වී ඇති බැවින් වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් වින්දිත දරුවා වෙත 1978

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කරදී ඇති 'කෲර අමානුෂික වදහිංසාව හෝ අවමන් සහගත සැලකිල්ලකට ලක් නොවී ජීවත් වීමේ අයිතිය' උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

පැමිණිල්ල සම්බන්ධව සිදුකළ වැඩිදුර විමර්ශනයේදී ඉහත පරිදි කරුණු අනාවරණය වී පැවතියදී 2018-09-05 දින පැමිණිලි පාර්ශවය කැඳවා සිදුකළ වැඩිදුර කරුණු විමසීමේදී, මෙම පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාළව දෙහිවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර තිබූ පැමිණිල්ල සමථ මණ්ඩලය වෙත යොමු කිරීමෙන් අනතුරුව දෙපාර්ශවය සමථයකට එකගතාවය පළ කර ඇති බවත්, ඒ අනුව තවදුරටත් පැමිණිල්ල සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාව මගින් කටයුතු කිරීම අවශ්‍ය නොවන බවත් පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත. එහිදී පරීක්ෂණ නිලධාරී විසින් ඒ බවට ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස පැමිණිලි පාර්ශවය වෙත උපදෙස් ලබාදී ඇති අතර 2018-12-26 දිනැති පැමිණිලිකාරියගේ ලිඛිත ප්‍රකාශය මගින්ද පැමිණිල්ල තවදුරටත් පවත්වාගෙන යෑමට අවශ්‍ය නොවන බව අවධාරණය කර ඇත. මීට අමතරව අදාළ විදුහල්පතිවරයා ඒ වනවිට විශ්‍රාම ගැනීමට ආසන්නව සිටින බැවින් සහ මෙම සිද්ධියට අදාළ කාරණයට වෙනත් පාර්ශවකරුවන්ගේ මැදිහත් වීම මත සිදුවූ හානිය වෙනුවෙන් හානිපූරණයක් සිදු කර ඇති බැවින් තවදුරටත් වගඋත්තරකරු වෙතින් යමක් අපේක්ෂා කිරීම සාධාරණ නොවන බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකරන ලෙසට පැමිණිලිකරු ඉල්ලා ඇත.

**නිර්දේශය :-**

01. ඒ අනුව, වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් වින්දිත දරුවා වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කරදී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනාවරණය වී ඇතත්, මේ වන විටත් වගඋත්තරකාර පී.ජී.ඩී චන්ද්‍රසෝම පතිරණ මහතා සේවයෙන් විශ්‍රාම ගොස් තිබීම සහ පැමිණිලි පාර්ශවය විසින් වගඋත්තරකරුට එරෙහිව පියවර නොගන්නා ලෙසට සිදුකරන ලද ඉල්ලීමත් මත මෙම වගඋත්තරකරු සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් නොකරනු ලැබේ.

02. කෙසේ වෙතත්, මවැනි සිදුවීම් ඉදිරියේදී ඇති නොවීම සඳහා "ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාව" මැයෙන් යුතුව අංක 2012/37 හා 2012.10.05 දිනැතිව ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය විසින් නිකුත් ඇති චක්‍රලේඛය හා

"පාසල තුළ විනය ආරක්ෂා කිරීම" මැයෙන් යුතුව 2016.04.29 දිනැතිව අංක 12/2016 යටතේ ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සම්බන්ධයෙන් අදාළ විදුහල්පතිවරුන් ඇතුළු ගුරු භවතුන් නිරන්තරයෙන් දැනුවත් කිරීමට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිර්දේශ කරනු ලැබේ.

2023.01.25 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| අනුසූයා ෂන්මුගනාදන්,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | ම.හේ. නිමල් කරුණාසිරි<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| Ms. Anusuya Shanmuganathan<br>Commissioner<br>Human Rights Commissioner of Sri Lanka | Dr. M<br>Human Ri<br>Lanka |

පිටපත :-

01. අමාත්‍යතුමා,
    අධ්‍යාපන අමාත්‍යාංශය,
    ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්
    අධ්‍යාපන අමාත්‍යාංශය,
    ඉසුරුපාය, බත්තරමුල්ල.

B/-